සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
**Second Term Evaluation - 2016**

| | | |
|---|---|---|
| 10 ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 | ක්‍රිස්තියානි ධර්මය I පත්‍රය<br>கிறிஸ்தவம் வினாத்தாள்-I<br>Christianity Paper I | පැය එකයි<br>ஒரு மணித்தியாலம்<br>One Hour |

සැලකිය යුතුයි
(i) සියලුම ප්‍රශ්න වල පිළිතුරු සපයන්න
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුරු තෝරා ගන්න

1) "මෙසියස් " යන්නෙහි අර්ථය වන්නේ.
i) දෙවියන් වහන්සේගේ දායාදය
ii) ආලේප ලත් තැනැත්තා
iii) පුහුණු කර යවනු ලැබූවන්
iv) දෙවියන් වහන්සේ මුදන සේක

2) "අන්ධකාරයේ ඇවිද්ද සෙනග මහත් ආලෝකයක් දුටුවෝය" මෙම පාඨය සඳහන් ග්‍රන්ථය වන්නේ,
i) යෙසායා ii) මීකා iii) දානියෙල් iv) එසකියෙල්

3) සෙකරියස්ගේ ප්‍රශංසා ගීයට අයත් කරුණක් නොවන්නේ,
i) පුත්‍රයාගේ මෙහෙවර වන්නේ ජනතාව මනස්ථාපනයට කැඳවීමයි.
ii) ජේසුස් වහන්සේ අදහගත් අයට පව් කමාවෙන් ගැලවීම ලැබෙන බව
iii) මෙසියස් වහන්සේ තුලින් ඊශ්‍රායෙල් ජාතින් නොවන අයටද ජීවිතාලෝකය ලැබෙන බව
iv) ජේසුස් වහන්සේගේ මෙහෙවරට" පෙරමඟ සැකසීම තම පුත්‍රයා විසින් ඉටු කරන බව

4) චර්මච්ඡේදන පිළිවෙත ආරම්භ කරනුයේ
i) ආදම් ii) ආබ්‍රහම් iii) ඊසාක් iv) මෝසෙස්

5) මනස්ථාපනයේ බාහිර සලකුණ වන්නේ .
i) බෞතීස්මය ii) චර්මච්ඡේදනය iii) කැපකිරීම iv) යාච්ඤාව

6) ජුදෙව් නමස්කාරයේ කේන්ද්‍රස්ථානය වන්නේ ,
i) සිනයෝගය ii) ජෙරුසලම් දේව මාලිගාව iii) ප්‍රශංසාව iv) පූජාවන්

7) ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් 12 දෙනාට චාරිකාව සඳහා ගෙන නොයෑමට පැවසුවේ,
i) පාවහන් ii) සැරයටිය iii) පසුම්බිය iv) බයිබලය

8) ක්‍රිස්තුස් වහන්සේගේ මෙහෙවරෙහි මූලික අරමුණ වූයේ .
i) වහලුන්ට මිදීම
ii) අන්ධයන්ට පෙනීම
iii) දේව වචනය කියා දීම
iv) දේව රාජ්‍යය මුළු ලෝකය තුල ස්ථාපිත කිරීම

9) තම ධාර්මික බව ගැන අතිශයින් උඩඟු වූ ආගමික කණ්ඩායම වන්නේ
i) සද්දුසිවරු ii) පරිසිවරු iii) විනයධරයෝ iv) පූජකයින්

10) ජේසුස් වහන්සේ සේවය කළ මුළු කාලය වන්නේ,
i) වසර 3 කි ii) වසර 4 කි iii) වසර 6 කි iv) වසර 2 කි

11) ජේසුස් වහන්සේ පිළිතුරක් දීම වෙනුවට ප්‍රති - ප්‍රශ්නයක් ඇසූ අවස්ථා වන්නේ,
i) දේවදූතයින් හා පුනර්ජීවනය පිළිබඳ ප්‍රශ්නය ii) උපවාසය පිළිබඳ ප්‍රශ්නය
iii) සබත කඩකිරීමේ පිළිබඳ ප්‍රශ්නය iv) අධිකාරි බලය පිළිබඳ ප්‍රශ්නය

12) කුදු ස්ත්‍රිය අශුද්ධ බලවේගයකට යටත් වූයේ,
i)වසර 12 කි ii) වසර 14 කි iii) වසර 18 කි iv) වසර 20 කි

13) දේව රාජ්‍යයේ අයිතිකරුවෝ වන්නේ,
i) ධර්මිෂ්ඨ අය ii) කුඩා දරුවෝ iii) ආගමික නායකයෝ iv) සියලු දෙනාම

14) සමාජයේ ප්‍රතික්ෂේප කළ ජාතියක් වන්නේ.
i) සමාරිතයින් ii) පිලිස්තිවරු iii) අමෝනිවරු iv) අයකැමියන්

15) උපවාස කරන ලද කණ්ඩායමක් වන්නේ,
i) ශ්‍රාවකයින් ii) සද්දුසිවරු iii) පරිසිවරු iv) පූජකයින්

16) පුනර්ජීවනය ,දේවදූතයින් ගැන විශ්වාස නොකළ ආගමික කණ්ඩායම වන්නේ ,
i) සද්දුසිවරු ii) පරිසිවරු iii) විනයධරයෝ iv) උත්තම පූජකයන්

17) ජේසුස් වහන්සේ පාවා දුන් ගෝලයා වන්නේ,
i) පේදුරු ii) යූදාස් iii) යොහාන් iv) බර්තලෙමේවුස්

18) අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහයෙන් පසු ජේසුස් වහන්සේ ගියේ,
i) පාළුකරයට ii) ගලීලයේ මුහුදට
iii) ඔලිව් කන්දට iv) ජෙරුසලම් දේව මාලිගාවට

19) පේදුරු විසින් ජේසුස් වහන්සේ නොහඳුනන බව පැවසුවේ,
i) 3 වරක් ii) 2 වරක් iii) 1 වරක් iv) 4 වරක්

20) ඇලෙක්සෙන්දර්ගේද රූපස්ගේද පියා වූයේ,
i) අරිමාතියේ ජෝසෙප් ii) පාවුල් iii) කිරේනියේ සීමොන් iv) පේදුරු

21) ජේසුගේ පුනර්ජීවනය පිළිබඳ විශ්වාස නොකරන කිතුනුවා,
i) බහු ආගමික වේ ii) දේව කැමැත්තට පිටුපායි
iii) දේවස්ථානයට යාම මඟ හරියි iv) උන්වහන්සේ මළවුන් අතර සොයයි

22) පෙර මඟ දූතයා ලෙස පැමිණියේ.
i) ජේසුස් වහන්සේ ii) දිවැසිවරු iii) ස්නාවක ජොහාන් iv) රජවරු

23) මිනිසා සහ දෙවියන් වහන්සේ අතර තිබූ සම්බන්ධතාවය පළුදු වූයේ,
i) ආදම් සහ ඒව නිසා ii) ජන්ම පාපය නිසා
iii) අකීකරුකම නිසා iv) ජේසුස් වහන්සේ කුරුසිපත් කළ නිසා

24) "මාගේ ස්වාමින් වහන්සේගේ මෑණියන් ලෙස" මරියතුමියව හඳුනා ගත්තේ,

i) ගාබ්‍රියෙල් ii) සෙකරියස් ii) ජෝසෙප් iv) එළිසබෙත්

25) ජේසුස් වහන්සේ විසින් දිළිඳු අය ලෙස හැඳින් වූයේ,

i) ශාරීරිකව දිළිඳු අය
ii) මානසිකව දිළිඳු අය
iii) ආත්මිකව දිළිඳු අය
iv) සියල්ලම නිවැරදිය

26) ජුදෙව් නීති පද්ධතියට අනුව වහලුන්ව නිදහස් කිරීම අනිවාර්ය වූයේ,

i) ජුබිලි වර්ෂයේදි
ii) පාස්කු මංගල්‍යයේදී
iii) කූඩාරම් මංගල්‍යයේදී
iv) නාබුල් ඵල මංගල්‍යයේදී

27) ශාරපෙත්හි වැන්දඹුව පෝෂණය කිරීමට දෙවියන් වහන්සේ තෝරාගත් දිවැසිවරයා වන්නේ ,

i) එලිෂා දිවැසිවරයා
ii) එළියා දිවැසිවරයා
iii) ජොහාන් බෞතිස්ත
iv) යෙසායා දිවැසිවරයා

28) ජේසුස් වහන්සේ මෙලොව තුළ සම්පූර්ණ කළ තුන් ප්‍රකාර නියමය වන්නේ ,

i) පූජක, දිවැසිවර , රජ
ii) රජ, දේව, දිවැසිවර
iii) රජ, පූජක, දිවැසිවර
iv) පූජක, දේව, දිවැසිවර

29) ජේසුස් වහන්සේගේ ගෝල පිරිසට අයත් වූ ධීවරයෙකු හා අයකැමියෙකු වන්නේ ,

i) ජේදුරු හා ජාකොබ්
ii) පේදුරු හා තෝමස්
iii) පේදුරු හා මතෙව්
iv) මතෙව් හා පිලිප්

30) අල්පේවුස්ගේ පුත්‍රයා ලෙස හැඳින්වූ ගෝලයා වන්නේ ,

i) ජාකොබ් ii) පේදුරු iii) තෝමස් iv) තෝමස්

31) පවුලේ සාමාජිකයන් වීමට නම් අප:

i) යාච්ඤා කළ යුතුයි.
ii) රණ අණ පිළිපැදිය යුතුය
iii) සැමට ප්‍රේම කළ යුතුය
iv) දේව වචනය අසා එය පිළිපැදිය යුතුය.

32) ජේසුස් වහන්සේගේ කමාවේ වැදගත්කම වන්නේ

i) සීමා රහිත වීමයි.
ii) ප්‍රේමයෙන් කමාව දීමයි
iii) ඉවසිලිවන්තව අපට සමාව දීමයි
iv) අපගේ පව් වලට දඬුවම් නොදී කිරීමයි.

33) දේව මාලිගාවේ බද්ද ගෙවීමට ජුදෙව් ජනතාව භාවිතා කළ කාසි වර්ගය වන්නේ

i) තඹ කාසි ii) දිනාර් කාසි iii) රෝම කාසි. iv) රිදී කාසි

34) කොටළුවා සංකේතවත් කරන්නේ

i) රණකාමීත්වය ii) බැගෑපත්කම iii) අහිංසකත්වය iv) කීකරුකම

35) එකම රොටි අනුභව කිරීම හා එකම කුසලානය පානය කිරීමෙන් සංකේතවත් කරන්නේ

i) සහෝදරත්වය හා සාධාරණත්වය
ii) සාමූහිකත්වය හා සාධාරණත්වය
iii) සහෝදරත්වය හා සහභාගිත්වය
iv) සාමූහිකත්වය හා සහභාගීත්වය

The national e-learning Portal for The General Education

36) යුදෙව් සමාජයේ යමෙක් ගෞරවයෙන් පිළිගැනීමට කරන චාරිත්‍රය වන්නේ

i) පාද සේදීම ii) සිඹීම iii) ආචාර කිරීම iv) රොටී කැඩීම

37) දොළොස් දෙනාගෙන් කෙනෙක් ජේසුස් වහන්සේ පාවාදෙන බවට පෙර ඇඟවීමක් කළේ වන්නේ

i) ගෙත්සෙමන උයනේදීය ii) අන්තිම රාත්‍රී භෝජනයේදීය

iii) ඔලීව කන්දේදී iv) මුල් ශ්‍රාවකයන් කැඳවීමේදී

38) කාන්තාවන් සතියේ පළමුවන දින සොහොන වෙතට ගියේ,

i) මෘත දේහය ඇත්දැයි බැලීමට ii) සොහොන ආරක්ෂා කිරීමට

iii) මෘත දේහය සුවඳ ද්‍රව්‍යයෙන් ආලේප කිරීමට iv) ජීවමාන තැනන්වහන්සේ බැලීමට

39) එම්මවුස් ගමන ගිය ගෝලයින් ගණන වනුයේ, වන්නේ

i) 2යි. ii) 3යි. iii) 12යි iv) 13යි.

40) ජීවමාන වැඩසිටීම පිළිබඳ සකල ලෝක වාසීන් වෙත ගොස් සාක්ෂි දරු පුද්ගලයන් වන්නේ,

i) පිලිප් හා පේදුරු ii) පිලිප් හා පාවුල් iii) පාවුල් හා ක්ලේයෝපස් iv) පේදුරු හා පාවුල්

ලකුණු 40 x 1 = 40

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි |
முழுப் பதிப்புரிமையுடையது |
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

10 ශ්‍රේණිය
தரம் 10
Grade 10

ක්‍රිස්තියානි ආගම II පත්‍රය
கிறிஸ்தவம் வினாத்தாள்-I-II
Christianity Paper II

පැය දෙකයි
இரண்டு மணித்தியாலங்கள்
Two Hours

සැලකිය යුතුයි

**පළමු වන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න 4ක් ඇතුළු සියලුම ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න**

1) අනිවාර්ය ප්‍රශ්නය

i) ජේසුස් වහන්සේ ගැන දිවැසි වැකි පැවසූ දිවැසිවරු 2ක් නම් කරන්න.

ii) දිවසිවරු යනුවෙන් හඳුන්වන්නේ කවුරුන්ද?

iii) ස්නාවක ජොහාන් ජේසුස් වහන්සේ ව තම අනුගාමිකයන්ට හඳුන්වා දුන්නේ කෙසේද?

iv) දේව දූතයා ජේසු බිළිඳු පිළිබඳ පැවසූ අනාවැකි 2ක් ලියන්න.

v) චර්මච්ඡේදන පිළිවෙතින් අර්ථකථනය කෙරෙන්නේ කුමක්ද?

vi) රෝම අධිරාජ්‍යට යටත්ව තිබූ පලස්තීනයේ ප්‍රදේශ 2ක් නම් කරන්න.

vii) ගලීලයේ මුහුදට යෙදෙන තවත් නම් 2ක් ලියන්න.

viii) ප්‍රේරිත යන්නෙහි අර්ථය කුමක්ද?

ix) ජේසුස් වහන්සේ සමග පුද්ගලික විමුක්තියට නැඹුරු වූ බයිබලයේ පුද්ගලයින් 2ක් නම් කරන්න.

x) පරිසිවරුන් පිළිබඳ කරුණු 2ක් සඳහන් කරන්න.

ලකුණු 10 x 2 = 20

2) "මා පියාණන් මැදුරේ සිටිය යුතු බව නුඹ නොදන්නෙහිද?"

i) මෙම ප්‍රකාශයෙන් ඉස්මතු වන වැදගත් කරුණු 2ක් ලියන්න. 2

ii) අවුරුදු 12 වියට පත් වූ යුදෙව් පිරිමි දරුවන්ට ලැබෙන වරප්‍රසාද 2ක් ලියන්න. 3

iii) ජේසුස් වහන්සේ කළ මෙම ප්‍රකාශයෙන් අපට ලැබෙන අභියෝග කුමක්ද? ඒ තුළින් කිතුනු දිවියේ නියම අරුත පහදන්න? 5

3) i) "ජොහාන් යන නමේ අරුත කුමක්ද? 2

ii) එතුමන් වෙත බෞතීස්ම ලැබීමට පැමිණි කණ්ඩායම් 3ක් නම් කරන්න. 3

iii) අපි බෞතීස්ම වීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කර මිතුරෙකු වෙත ලිපියක් ලියන්න 5

4) "මෙතැන් පටන් ඔබ මිනිසුන් දිනනු ඇත"

i) මෙහි අවස්ථා සම්බන්ධය ලියන්න. 2

ii) ඉන් ඉස්මතු වන ප්‍රධාන කරුණු 3ක් ලියන්න. 3

iii) අද අපි දේව සේවාව සඳහා නව සාමාජිකයන් එකතු කර ගන්නේ කෙසේද? ඒ තුළින් දේව රාජ්‍යය වර්ධනය කරන්නේ කෙසේදැයි විස්තර කරන්න. 5

5) i) ජේසුස් වහන්සේ පවුල පිළිබඳ දුන් නව ආකල්පය කුමක්ද? 2

ii) එදා සමාජයේ පව්කරුවන් ලෙස හැඳින්වූයේ කවුරුන්ද? 3

iii) අද සමාජයේ "අපි පව් කරුවන්" ලෙස හඳුන්වන්නේ කවුද? ඔවුන්ගේ ජීවිත පරිවර්තනයකට අපට කළ හැක්කේ කුමක්දැයි? නිදසුන් සහිතව පහදන්න. 5

6) "මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා"

i) මෙහි අවස්ථා සම්බන්ධය ලියන්න. 2

ii) ජේසුස් වහන්සේ අභියෝග මැද සාමය පෙන්නුම් කළ අවස්ථා 3ක් ලියන්න. 3

iii) පාසල් සමාජයක් තුළ දේව කැමැත්ත ඉටු කරන්නේ කෙසේදැයි වචන 150 කින් පහදන්න. 5

7) පහත සඳහන් මාතෘකා 2ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i) ජේසුස් වහන්සේ හා විනයධරයන් අතර ඇති වූ සංවාද

ii) දේව කැළඹීමට ප්‍රතිචාර දැක්වීම

iii) කාන්තාවන් හා දරුවන් පිළිබඳ නව දැක්මක්

iv) ජේසුස් වහන්සේගේ කුරුස පත් වීම

v) කිතුනු අපට නව බලාපොරොත්තුවක්